සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ. 419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O. Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: dcoopdev@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Web: www.coop.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: DCD/6/1/61

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2020.02.12

**චක්‍රලේඛ අංක:04/2020 (සමිති පොදු)**

දීප ව්‍යාප්ත සමුපකාර සමිති හා සංගම් වල ගරු සභාපතිවරුන් වෙත,

**<u>සමුපකාර සමිති/සංගම්වල සේවක පුරප්පාඩු පිරවීම</u>**

අනුමත පිරිස්බල තක්සේරුව අනුව තම සමිතියේ/ සංගමයේ අවශ්‍යතාවය සහ මූල්‍ය හැකියාව මත තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමත්, සමිතියේ/ සංගමයේ කටයුතු කාර්යක්ෂමව හා ලාභදායීව පවත්වාගෙන යාමට කටයුතු කිරීමත් සියළුම සමුපකාර සමිති/ සංගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සතු වගකීමකි.

02. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද සියළුම සමුපකාර සමිති/ සංගම්වල කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතිය ද, එකී තනතුරු සඳහා ස්ථිර සේවකයින් බඳවා නොගෙන වැඩබැලීමේ හා කොන්ත්‍රාත් පදනම මත නෛතික විධිවිධානයන් සැලකිල්ලට නොගෙන පුද්ගලයින් දීර්ඝ කාලීනව සේවයේ යොදවා ගැනීම සිදුවන බවට මා වෙත වාර්තා වී ඇත. මෙම තත්ත්වය ආයතනවල කාර්යක්ෂමතාවයට හා ඵලදායිතාවයට මෙන්ම පරිපාලනයට ද එතරම් හිතකර තත්ත්වයක් නොවන බව පෙන්වා දෙමි.

03. එබැවින් ඔබ සමුපකාර සමිතියේ/ සංගමයේ වැඩ බැලීමේ හා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති සේවකයින් සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති " සමුපකාර සේවක ආයතන සංග්‍රහයේ " විධිවිධාන අනුව කටයුතු කළයුතු බව කාරුණිකව දන්වමි.

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත්

1. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව - කරු. දැ.ගැ.පි.
2. සමුපකාර සමිති/ සංගම් අධීක්ෂණ නිලධාරීන් - කරු. දැ.ගැ.පි. හා ඔබ විසින් අධීක්ෂණය කරනු ලබන සමු. සමිතියේ සේවකයින් සම්බන්ධව සොයා බලා ඉහත උපදෙස් අනුව කටයුතු කිරීමට අවශ්‍ය මගපෙන්වීමට සහ මා වෙත වාර්තා කිරීමට